සන්නස
නව සහශ්‍රය
SANNASA

**සංස්කරණය/Editor**
අසෝක සුබසිංහ Asoka Subasinghe

**උපදේශක සංස්කාරක**
ජගත් ජේ එදිරිසිංහ Jagath J Edirisinghe

**සංස්කරණ සහය/Asst. Editors**
ශ්‍රීනාත් මද්දුමගේ Srinath Maddumage

**ක්‍රීඩා සංස්කාරක**
අසෝක සිල්වා Asoka Silva

**සන්නස පිරිවර**

සිසිර දිසානායක
වි ක ධර්මබන්ධු
ආචාර්ය විද්‍යානි මනතුංග
ශ්‍රියාණි මද්දුමගේ
චන්දි මාපා
මහින්ද දිසානායක දිවුල්ගනේ
ශ්‍රියා කුමාරසිංහ
මේනකා ජයතිලක

**සේයා රූ**
ප්‍රසන්න නාමල් කුරුකුලරත්න

**පිටු සැකසුම සහ ග්‍රැෆික් නිර්මාණ**
**Page Layout & Graphic Designs**
සාමන්ත තැන්නගේ Saamantha Tennege
**Horizon -** Jagath J Edirisinghe

**සම්බන්ධීකරණය**

| NSW | WA |
|---|---|
| Lakshman Kodituwakku | Kapila Hemantha |
| 02 9626 7660 | Balage |
| 02 9837 5055 | 08 9456 1972 |
| **QLD** | **ACT** |
| Ananda Samaratunga | Asoka Nimalasiri |
| 07 3372 7953 | 0400 429 031 |
| **SA** | **TAS** |
| Chandra Eeriyagama | Anura Seneviratne |
| 08 8331 2318 | 03 6327 4259 |

Sannasa
61 Nettle Drive
Hallam Vic 3803 Australia
Web: www.sannasa.net
email : sannasanews@gmail.com
Tel/Fax : 03 9796 4241

පුවත්පතේ පලවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා/ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සලකන්න සන්නස නව සහශ්‍රයට පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත.

CIRCULATION - 10000 COPIES IN AUSTRALIA

### සංස්කාරක සටහන

නව සහශ්‍රයට සන්නස පුවත්පත විවෘත වේදිකාවකි. මෙහි පළවන ලිපි වල අන්තර්ගත වන්නේ එම ලිපි ලියන ලේඛකයනගේ අදහස් ය. ඒ ලිපි තුළින් කතා බහ කෙරෙන කාරණා පිළිබඳව ඔබට ද මතයක් ඇත්නම් ඔබේ අදහසට ද ඉඩක් ලබා දෙන්නට අපි සැමවිටම උත්සාහ කරන්නෙමු. ඔබේ ලිපිය ඉතා කෙටියෙන් ලියන්න. පුවත් පතේ ඉඩ, අදහස නිරවුල් ව ඉදිරිපත් නොකිරීම, වැරදි භාෂාව, වැනි හේතු මත සියලුම ලිපි සංස්කරණයට භාජනය විය හැකි බව සළකන්න.

## අලුත් මැතිවරණ ක්‍රමයක් අවශ්‍ය ය

ඔක්තෝබර් 10 වන දින පැවැත්වෙන දකුණු පළාත් සභා මැතිවරණය වෙනුවෙන් ඡන්ද සටන දැන් ඇරඹී ඇත. එය පක්ෂ අතර මතවාදී සටනක් වනු වෙනුවට එකම පක්ෂයේ අපේක්ෂකයන් අතර සන්නද්ධ සටනක් වී ඇති අයුරු දකින විට ඇති වන්නේ කණගාටුවකි. මේ ජුගුප්සාජනක තත්වයට මැතිවරණ පත්වී ඇත්තේ අනුපාත ක්‍රමය නමැති විකාරය බලහත්කාරයෙන් අප මත පටවා ඇති බැවිනි

අවසන් වරට ඡන්ද කොට්ඨාශ පදනමින් මැතිවරණයක් පැවැත්වුණේ 1977 දී ය. ඒ දැනට වසර 23 කට පෙරදී ය. එයින් ජයගත් ජේ ආර් ජයවර්ධන සදාකල් තම පක්ෂයට ම බලය තබාගන්නා පටු අදහසින් අනුපාත ක්‍රමය නම් වන පාපය රට මත පැටෙව්වේ ය. අද ඒ අදූරදර්ශී තීරණයෙහි ප්‍රතිඵල අපේ ඇස් පනාසිටම දැක ගත හැකි ය.

මැතිවරණ කොට්ඨාශ පදනමින් මන්ත්‍රීවරුන් තෝරා ගන්නා විට තම ඡන්ද කොට්ඨාශය කෙරෙහි වගකීමක් අනිවාර්යයෙන් ඔහු මත පැටවෙයි. අනෙක් අතින් තම මන්ත්‍රිවරයා කව්දැයි ඡන්ද දායකයෝද දැන සිටිති. අනුපාත ක්‍රමයෙන් සිදුවන්නේ කිසිවෙකුට වග නොකියන මුදල් මතින් මනාප ගරා ගන්නා තක්කඩින් රැළක් මන්ත්‍රිවරුන් ලෙසින් පත්වීම පමණකි.

අනුපාත ක්‍රමයෙන් වාසි ලබන්නෝ ද සිටිති. ඒ සුලු ජාතික පක්ෂ හා සුලු දේශපාලන පක්ෂයි. අද ඔවුන්ට පාර්ලමේන්තුවේ ආසන හිමිවන්නේ අනුපාත ක්‍රමයට පින් සිදුවන්නට ය. එබැවින් අනුපාත ක්‍රමයේ සිදු කරනු ලබන කවර හෝ වෙනසකට ඔවුන් ගේ අනුමැතිය නොලැබීම ස්වභාවික ය.

තවදුරටත් මේ ව්‍යසනය දෙස නිහඬව බලා නොසිට පවතින අනුපාත ක්‍රමයේ වාසි හා අවාසි මැනැවින් කිරා බලා කේවල ආසන ක්‍රමය සහ අනුපාත ක්‍රමයේ සංකලනයක් වන මැතිවරණ ක්‍රමයකට යාමට තවත් ප්‍රමාද විය යුතු නැත.

# යුද්ධය අවසන්ද?

යුද්ධය අවසන්ද?

සරල උත්තරය නම් 'නැත' යන්නයි

යුද්ධය අවසාන යැයි විශ්වාස කරන්නේ වාර්ගික අර්බුදයේ ඉතිහාසය නොදත් පිරිස පමණකි.

එල්ටීටීඊ ත්‍රස්තවාදීනට අවුරුදු 30ක් තිස්සේ මේ යුද්ධය කරගෙන යාමට ශක්තිය ලැබුදේ කෙසේද?

මීට වසර 25කට පෙර මවිසින් ලියා නවදිල්ලියෙන් ප්‍රකාශයට පත් කරන ලද 'India "We Tamils" and Sri Lanka' නමැති පොතෙහි අරගලය දික් ගැස්සීමට උපකාරි වු අන්තර්ජාතික දෙමළ ව්‍යාපාරයෙන් සුළු මුල දීර්ඝ වශයෙන් විස්තර කළෙමි. (අපි දෙමළ (නාන් තමිසාර්) ව්‍යාපාරය ඔස්සේ බිහිවුණු

(ඔස්ට්‍රේලියාවේ පාර්ලිමේන්තු මැතිවරණ තීරණය වන්නේ කෙසේදැයි අපි දනිමු. ලිබරල් සන්ධානයට හා කම්කරු ප්‍රාග්ධනයට තම තමන්ගේ අනගිභවනීය බලකොටු ඇත.

මේ බලකොටු හැරුණු විට 'පාවෙන' ආසන සැලකිය යුතු සංඛ්‍යාවක් තිබේ.

කිරීම නිසා කම්කරු පක්ෂය තුළ කැපී පෙනෙන්නට ඔහුට අවස්ථාව ලැබුණේය. ඊට පෙර මැතිවරණයේ දී කම්කරු පසු අපේක්ෂකයා ලබාගෙන තිබුණේ ප්‍රකාශිත ඡන්දවලින් 12.7% කි. ඩයස්පෝරා අපේක්ෂකයා 13.8% ක් ලබාගැනීමද ඔහුගේ වාසනාවට හේතු වීය.

ලෝකයේ බොහෝ ප්‍රජාතාන්ත්‍රවාදී

***"අපි දෙමළ " ව්‍යාපාරය තුළින් පණ ගැන්වුනු ඩයස්පෝරාව පරාජය කල නොහැකිද? එසේ කිරීමට විශාල බාධාවක් වී ඇත්තේ ශ්‍රී ලංකාවේ දේශපාලන තලයේ ඇතැම් කොටස් රට මුහුණ පා ඇති මේ භයානක තත්වය තේරුම් නොගෙන සිටීමය. එක් දේශපාන නායකයෙකු කියා ඇත්තේ රජය ප්‍රජාතාන්ත්‍රවාදීව කටයුතු කරන්නේ නම් "අපි ඩීජ ෑ සහනය ලබා දීමට ක්‍රියා කරනවා" යනුවෙනි. මෙය හතර බීරි කතාවකි. 1940 දී එංගලන්තයෙන් කම්කරු විපක්ෂය මෙබදු ප්‍රතිපත්තියක් අනුගමනය කලේ නම් මුළු ලෝකයම ජර්මනියේ පැසිස්ට් ඒකාධිපතිත්වයට යටත් වීමට ඉඩ තිබුණේය.***

රටවල ඩයස්පෝරාවේ දෙමළ ක්‍රියාකාරී හු පසු දේශපාලනයෙන් වැදගත් ස්ථ ානයක් ලබා ගනිමින් එමගින් සිය අදහස් ඇමති-මැතිවරුනට කාවැද්දීමට ද සමත් වුහ. ඕස්ට්‍රේලියාවේ දී ඩයස්පෝරාව දෙකට බෙදුණු බවත් පෙන්වමින් සමහර තැන්වල කම්කරු පක්ෂය ද, තවත් තැන්වල ලිබරල් පක්ෂයද, උද්යෝගයෙන් මැතිවරණ ප්‍රචාරණ කටයුතු වල යෙදුණු බව නොරහසකි.

(තමිල්නාඩුවේද 'අපි දෙමළ' ව්‍යාපාරය

අන්තර් ජාතික ඩයස්පෝරාව නොතිබෙන්නට ප්‍රභාකරන්ට අවුරුදු 30 ක් තබා සති 30ක් වත් හමුදාවට විරුද්ධව යුද්ධයක් ගෙන යාමට හැකියාවක් තිබුණේ නැත.

(නවීන ආයුධවලින් සන්නද්ධ වීම සඳහා ප්‍රභාකරන්නට ඩොලර් කෝටි ගණනින් මුදල් රැස්කර දුන්නේ මේ ඩයස්පෝරාවයි. අන්තර් ජාතික වශයෙන් ශ්‍රී ලංකාවට විරුද්ධව බලවත් ජනමතයක් ගොඩනැංවීම සඳහා අර්ධ සත්‍යය , අතිශයෝක්තිය, සහ ගල් පැලෙන බොරු ප්‍රචාරත් ගෙන යෑමට ඩයස්පෝරාවෙන් ලැබුණ සහයෝගය අති විශාල ය.

ඩයස්පෝරාව ක්‍රියා කළේ කොයි අන්දමින්ද? ඔවුන් ලෝකයේ බලවත් දේශපාලන පක්ෂවලට බැදුණේ කෙසේද?

(අපි ඔස්ට්‍රේලියාවෙන් එක් නිදර්ශනයක් ගනිමු.

මැතිවරණයේ ජයග්‍රහණය රඳා පවතින්නේ ඉහත කී 'පාවෙන' ඡන්ද දයකයන්ගේ තීරණය අනුවය.

(ටික කලක් හෝ ලිබරල් සන්ධානයේ නායකත්වය දැරූ බ්‍රැන්ඩන් නෙල්සන් මහතාගේ දකුණු සිඩ්නි ආසනය ලිබරල් පක්ෂයෙන් අනගිබවනීය බලකොටුවකි. කම්කරු පක්ෂය ඒ අසුනට තරඟ කරන්නේ 'නාමිකව' අපේක්ෂකයකු ඉදිරිපත් කිරීමෙනි.

(කොටි සංවිධානයේ ප්‍රබල හිතවතෙකු වු සංක්‍රමණික දෙමළ ඉංජිනේරුවරයෙක් මේ කොට්ඨාසය තුළ කම්කරු පක්ෂ ශාඛාවල අලුත් සාමාජිකයන් ඇතිකර ගනිමින් පසුගිය මැතිවරණයකදී (2004 ?) අපේක්ෂකත්වය දිනාගැනීමට සමත් විය. ඩයස්පෝරාව අපේක්ෂා කළ අන්දමින්ම මොහු ඡන්ද 13% ක් පමණක් ලබාගෙන පරාජය වු නමුත් බ්‍රැන්ඩන් නෙල්සන් සමඟ තරඟ

12 වන පිටුවට



*ඉන්දියාවේ හිටපු නියෝජ්‍ය මහ කොමසාරිස්*

එස්. පියසේන